(අටවැනි පාර්ලිමේන්තුව - තෙවැනි සභාවාරය)

අංක 79.]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2019 ජූලි 24 වැනි බදාදා අ.භා. 1.00 ට**

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **කරු ජයසූරිය මහතා,** කථානායකතුමා

ගරු **ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා

ගරු **සෙල්වම් අඩෛක්කලනාදන් මහතා,** නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමා

---

ගරු **තලතා අතුකෝරල මහත්මිය,** අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමිය

ගරු **වජිර අබේවර්ධන මහතා,** අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා

ගරු **ජෝන් අමරතුංග මහතා,** සංචාරක සංවර්ධන, වනජීවී සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමා

ගරු **ගයන්ත කරුණාතිලක මහතා,** ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **රවී කරුණානායක මහතා,** විදුලිබල, බලශක්ති සහ ව්‍යාපාර සංවර්ධන අමාත්‍යතුමා

ගරු **ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,** බුද්ධ ශාසන හා වයඹ සංවර්ධන අමාත්‍යතුමා

ගරු **ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා,** රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ සහ ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍යතුමා

ගරු **තිලක් මාරපන මහතා,** විදේශ කටයුතු අමාත්‍යතුමා

ගරු **සාගල රත්නායක මහතා,** වරාය හා නාවික කටයුතු සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමා

ගරු **අර්ජුන රණතුංග මහතා,** ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා,** සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා

ගරු **අබ්දුල් හලීම් මහතා,** තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,** අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන ආර්ථික ප්‍රතිසංස්කරණ සහ පොදු සැපයීම් අමාත්‍යතුමා

ගරු **අජිත් පී. පෙරේරා මහතා,** අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන ඩිජිටල් යටිතල පහසුකම් හා තොරතුරු තාක්ෂණ අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) වී. රාධක්‍රිෂ්ණන් මහතා,** අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන විශේෂ ප්‍රදේශ සංවර්ධන අමාත්‍යතුමා

ගරු **සුජීව සේනසිංහ මහතා,** අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා

ගරු **අශෝක් අබේසිංහ මහතා,** ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජේ. සී. අලවතුවල මහතා,** අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **රංජිත් අලුවිහාරේ මහතා,** සංචාරක සංවර්ධන, වනජීවී හා ක්‍රිස්තියානි ආගමික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **වසන්ත අලුවිහාරේ මහතා,** කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලකී ජයවර්ධන මහතා,** නගර සැලසුම් හා ජල සම්පාදන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විජයකලා මහේස්වරන් මහත්මිය,** අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **වඩිවේල් සුරේෂ් මහතා,** වැවිලි කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **වසන්ත සේනානායක මහතා,** විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) අනෝමා ගමගේ මහත්මිය,** ඛනිජ තෙල් සම්පත් සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමිය

ගරු **එඩ්වඩ් ගුණසේකර මහතා,** ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නලින් බණ්ඩාර ජයමහ මහතා,** සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **පාලිත කුමාර තෙවරප්පෙරුම මහතා,** සමාජ සවිබලගැන්වීම් නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **බුද්ධික පතිරණ මහතා,** කර්මාන්ත හා වාණිජ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **කරුණාරත්න පරණවිතාන මහතා,** නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු නියෝජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **හෙක්ටර් අප්පුහාමි මහතා**

ගරු **මහින්ද යාපා අබේවර්ධන මහතා**

ගරු **මහින්ද අමරවීර මහතා**

ගරු **තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**

ගරු **දිළුම් අමුණුගම මහතා**

ගරු **ඩලස් අලහප්පෙරුම මහතා**

ගරු **ආනන්ද අලුත්ගමගේ මහතා**

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා

ගරු ටී. බී. ඒකනායක මහතා

ගරු ෆයිසාල් කාසිම් මහතා

ගරු වේලු කුමාර් මහතා

ගරු නාලක ප්‍රසාද් කොලොන්නෙ මහතා

ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා

ගරු නිහාල් ගලප්පත්ති මහතා

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා

ගරු එස්. එම්. චන්ද්‍රසේන මහතා

ගරු ඩී. වී. චානක මහතා

ගරු සිසිර ජයකොඩි මහතා

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා

ගරු පියංකර ජයරත්න මහතා

ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු දයාසිරි ජයසේකර මහතා

ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා

ගරු ක. තුරෙයිරෙත්නසිංහම් මහතා

ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා

ගරු එම්. එස්. තෞෆික් මහතා

ගරු සිරිනාල් ද මෙල් මහතා

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා

ගරු අනුර දිසානායක මහතා

ගරු දුමින්ද දිසානායක මහතා

ගරු එස්. බී. දිසානායක මහතා

ගරු වීරකුමාර දිසානායක මහතා

ගරු සාලින්ද දිසානායක මහතා

ගරු එච්. ආර්. සාරතී දුෂ්මන්ත මහතා

ගරු ඩග්ලස් දේවානන්ද මහතා

ගරු වාසුදේව නානායක්කාර මහතා

ගරු මුහම්මදු නසීර් මහතා

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා

ගරු කේ. කේ. පියදාස මහතා

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා

ගරු ඩිලාන් පෙරේරා මහතා

ගරු සනත් නිශාන්ත පෙරේරා මහතා

ගරු සුජිත් සංජය පෙරේරා මහතා

ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා

ගරු ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා

ගරු එස්. ප්‍රේමරත්න මහතා

ගරු පාලිත රන්ගේ බණ්ඩාර මහතා

ගරු ශාන්ත බණ්ඩාර මහතා

ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා

ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා

ගරු රිසාඩ් බදියුදීන් මහතා

ගරු තාරක බාලසූරිය මහතා

ගරු මුහම්මදු ඉබ්රාහිම් මුහම්මදු මන්සූර් මහතා

ගරු එස්. එම්. මරික්කාර් මහතා

ගරු සෙය්යිඩ් අලී සාහීර් මවුලානා මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා

ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා

ගරු සීනිතම්බි යෝහේස්වරන් මහතා

ගරු බිමල් රත්නායක මහතා

ගරු සී. බී. රත්නායක මහතා

ගරු ලොහාන් රත්වත්තේ මහතා

ගරු ප්‍රසන්න රණතුංග මහතා

ගරු ප්‍රසන්න රණවීර මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු චමල් රාජපක්ෂ මහතා

ගරු මහින්ද රාජපක්ෂ මහතා, පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

ගරු අංගජන් රාමනාදන් මහතා

ගරු නිමල් ලාන්සා මහතා

ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය

ගරු විදුර වික්‍රමනායක මහතා

ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා

ගරු ඒ. ඒ. විජේතුංග මහතා

ගරු ලක්ෂ්මන් ආනන්ද විජේමාන්න මහතා

ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

ගරු චමින්ද විජේසිරි මහතා

ගරු කංචන විජේසේකර මහතා

ගරු ඩුලිප් විජේසේකර මහතා

ගරු හේෂා විතානගේ මහතා

ගරු තේනුක විදානගමගේ මහතා

ගරු චන්දිම වීරක්කොඩි මහතා

ගරු කුමාර වෙල්ගම මහතා

ගරු එස්. ශ්‍රීතරන් මහතා

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා

ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය

ගරු ජයන්ත සමරවීර මහතා

ගරු සන්දිත් සමරසිංහ මහතා

ගරු ඊ. සරවනපවන් මහතා

ගරු ධර්මලිංගම් සිද්ධාර්ථන් මහතා

ගරු මුත්තු සිවලිංගම් මහතා

ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා

ගරු ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න මහතා

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා

ගරු මාවෛ සෝ. සේනාධිරාජා මහතා

ගරු චතුර සංදීප සේනාරත්න මහතා

ගරු විජිත් විජයමුණි සොයිසා මහතා

ගරු ඩී. එම්. ස්වාමිනාදන් මහතා

ගරු රවුෆ් හකීම් මහතා

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා

ගරු එච්. එම්. එම්. හරීස් මහතා

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා

ගරු කනක හේරත් මහතා

ගරු ඒ. එච්. එම්. ෆවුසි මහතා

ගරු ෆීල්ඩ් මාර්ෂල් සරත් ෆොන්සේකා මහතා

ධම්මික දසනායක මහතා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

නීල් ඉද්දවල මහතා, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

කුෂානි රෝහණදීර මහත්මිය, සහකාර මහ ලේකම්

ටිකිරි කේ. ජයතිලක මහතා, සහකාර මහ ලේකම්

**කල් තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. කථානායකවරයා මූලාසනාරූඪ විය.**

1. **ජනාධිපතිවරයාගෙන් ලැබෙන සංදේශ :** ජනාධිපතිවරයාගෙන් ලැබුණු මතු පළවන සංදේශය කථානායකවරයා විසින් කියවන ලදී:—

ශ්‍රී ලංකා ජනාධිපති
இலங்கை சனாதிபதி
President of Sri Lanka

මගේ අංකය : පීඑස්/සීඑස්ඒ/00/1/12/6

2019 ජූලි මස 22 වන දින

ගරු කථානායකතුමා
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

ගරු කථානායකතුමනි,

**මහජන ආරක්ෂක ආඥා පනත**

මහජන ආරක්ෂක ආඥා පනතේ 2 වැනි වගන්තිය යටතේ 2019.07.22 දාතමින් කරනු ලබන ප්‍රකාශනය මගින් ඉහත කී ආඥා පනතේ II වන කොටසේ විධිවිධාන ශ්‍රී ලංකාව මුළුල්ලේම වර්ෂ 2019 ක් වූ ජූලි මස 22 වන දින සිට ක්‍රියාත්මක විය යුතු බව ම විසින් ප්‍රකාශ කරන ලදී.

ඉහත කී ප්‍රකාශනය කිරීමට හේතුව මහජන සාමය ආරක්ෂා කිරීම හා මහජනතාවගේ ජීවිතයට අත්‍යවශ්‍ය සැපයීම් හා සේවා පවත්වා ගෙන යාම සඳහා බව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155 වන ව්‍යවස්ථාවේ (4) වන අනු ව්‍යවස්ථාව අනුව ක්‍රියා කරමින් පාර්ලිමේන්තුව වෙත දැනුම් දෙනු ලැබේ.

මෙයට - විශ්වාසී,

මෛත්‍රීපාල සිරිසේන

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
இலங்கைச் சனநாயக சோசலிசக் குடியரசு
Democratic Socialist Republic of Sri Lanka

**2. ලිපිලේඛනාදිය පිළිගැන්වීම** : (1) කථානායකවරයා විසින්—

(i) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ආ(6) සහ 153උ ව්‍යවස්ථා ප්‍රකාරව, 2019 වර්ෂයේ පළමු කාර්තුව (2019.01.01 - 2019.03.31) සඳහා විගණන සේවා කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව; සහ

(ii) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ආ(6) ව්‍යවස්ථාව ප්‍රකාරව, 2019 වර්ෂයේ පළමු කාර්තුව (2019.01.01 - 2019.03.31) සඳහා සීමා නිර්ණය කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව

පිළිගන්වන ලදී.

එකී යන ලද වාර්තා **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

(2) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්, 2016 වර්ෂය සඳහා ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව හා ගිණුම් පිළිගන්වා, එම වාර්තාව තිරසර සංවර්ධනය හා පරිසරය සහ ස්වභාවික සම්පත් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(3) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්, 2018 වර්ෂය සඳහා වරාය හා නාවික කටයුතු සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව පිළිගන්වා, එම වාර්තාව ප්‍රවාහනය හා සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(4) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්, 2015 සහ 2016 වර්ෂ සඳහා ජාතික ක්‍රීඩා අරමුදලේ වාර්ෂික වාර්තා පිළිගන්වා, එම වාර්තා තරුණ, ක්‍රීඩා, කලා හා උරුමයන් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(5) නගර සැලසුම්, ජල සම්පාදන හා උසස් අධ්‍යාපන වැඩ බලන අමාත්‍යවරයා විසින්, 2018 වර්ෂය සඳහා නගර සැලසුම් හා ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ උසස් අධ්‍යාපන අංශයේ වාර්ෂික වාර්තාව පිළිගන්වා, එම වාර්තාව අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(6) කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව දිගුකාලීනව අවතැන්වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම, සමුපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන වැඩබලන අමාත්‍යවරයා විසින්, 2012 වර්ෂය සඳහා සීමාසහිත ලංකා සතොස ආයතනයේ වාර්ෂික වාර්තාව පිළිගන්වා, එම වාර්තාව ව්‍යාපාර හා වාණිජ පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(7) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්, 2017 වර්ෂය සඳහා ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ වාර්ෂික වාර්තාව පිළිගන්වා, එම වාර්තාව අධ්‍යාපනය හා මානව

සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(8) ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින්, 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනතේ 6, 9, 17, 18 සහ 25 වගන්ති සමඟ කියවිය යුතු එකී පනතේ 204 වගන්තිය යටතේ ගීත හෝ සංගීතමය නිර්මාණවල හිමිකරුවන්ට කර්තෘභාග ගෙවීමේ යාන්ත්‍රණය ක්‍රියාත්මක කර ගැනීම සඳහා සහ සාමූහික සංගම් බලගැන්වීම සම්බන්ධයෙන් විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 ජූනි 17 දිනැති අංක 2128/6 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග පිළිගන්වා, එම නියෝග අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**3. මහජන පෙත්සම් පිළිගැන්වීම :**

(1) (i) කඳාන, රිලවුල්ල, වානියා වත්ත, අංක 85 දරන ස්ථානයෙහි පදිංචි එච්. ටෝනි ජයන්ත ෆොන්සේකා මහතාගෙන් ලැබුණු 2018.07.16 දිනැති පෙත්සම; සහ

(ii) පානදුර, මාලමුල්ල, "ලක්මාල්", අංක 318 A දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්. ඒ. චම්පිකා විජේසූරිය මහත්මියගෙන් ලැබුණු 2019.02.27 දිනැති පෙත්සම

ගරු ජෝන් අමරතුංග මහතා විසින් පිළිගන්වන ලදී.

(2) හොරණ, ඕවිටියාගල, අංක 338 දරන ස්ථානයෙහි පදිංචි එම්. ඩී. පී. ගුණතිලක ජයවර්ධන මහත්මියගෙන් ලැබුණු 2018.10.05 දිනැති පෙත්සම ගරු අජිත් පී. පෙරේරා මහතා විසින් පිළිගන්වන ලදී.

(3) (i) නාඋල, හපුගස්ලන්ද පාර, පිළිහුඩුගොල්ල යන ලිපිනයෙහි පදිංචි කේ. ජී. සුරංග සම්පත් බණ්ඩාර මහතාගෙන් ලැබුණු 2019.03.02 දිනැති පෙත්සම; සහ

(ii) මාතලේ, නාලන්ද, උඩුදෙණිය, අංක P 51/A දරන ස්ථානයෙහි පදිංචි කේ. එම්. පී. ප්‍රියරංජන මහතාගෙන් ලැබුණු 2019.04.07 දිනැති පෙත්සම

ගරු වසන්ත අලුවිහාරේ මහතා විසින් පිළිගන්වන ලදී.

(4) මාතලේ, අලුවිහාරේ, අංක 92/3 දරන ස්ථානයෙහි පදිංචි එස්. සෙනෙවිරත්න මහතාගෙන් ලැබුණු 2019.04.27 දිනැති පෙත්සම ගරු රංජිත් අලුවිහාරේ මහතා විසින් පිළිගන්වන ලදී.

(5) (i) රත්ගම, මාවඩවිල, පාලුවත්ත, "දිස්නා" යන ලිපිනයෙහි පදිංචි කේ. වී. කාන්ති චන්ද්‍රලතා මහත්මියගෙන් ලැබුණු 2019.03.21 දිනැති පෙත්සම; සහ

(ii) ඔට්ටමාවඩි, කාවත්තමුනේ, කඩදාසි කම්හල පාර යන ලිපිනයෙහි පදිංචි එම්. එච්. සෙයිදු උමර් මහතාගෙන් ලැබුණු 2019.03.21 දිනැති පෙත්සම

ගරු වාසුදේව නානායක්කාර මහතා විසින් පිළිගන්වන ලදී.

(6) (i) පරකඩුව, පුස්සැල්ල යන ලිපිනයෙහි පදිංචි එච්. ඒ. වී. ඒ. නවරත්න මහතාගෙන් ලැබුණු 2019.05.06 දිනැති පෙත්සම;

(ii) පැල්මඩුල්ල, රක්වාන පාර, අංක 95/14 දරන ස්ථානයෙහි පදිංචි කහවලගේ ප්‍රභාත් චමින්ද පෙරේරා මහතාගෙන් ලැබුණු 2019.04.04 දිනැති පෙත්සම;

(iii) ත්‍රිකුණාමලය, සාම්බල්තිව්, කොට්ඨාස අංක 6 දරන ස්ථානයෙහි පදිංචි කුලන්දවේලූ සකුන්තලා මහත්මියගෙන් ලැබුණු 2019.05.06 දිනැති පෙත්සම; සහ

(iv) ගම්පොළ, වේලම්බොඩ, වේරවෙල, අංක 132 දරන ස්ථානයෙහි පදිංචි එස්. එම්. ජයතිලක මහතාගෙන් ලැබුණු 2019.05.03 දිනැති පෙත්සම

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා විසින් පිළිගන්වන ලදී.

(7) (i) මැල්සිරිපුර, පල්ලෙකන්දවිල, පන්සල පිටුපස නිවස යන ලිපිනයෙහි පදිංචි පී. කේ. බී. ගුණතිලක මහතාගෙන් ලැබුණු 2019.03.29 දිනැති පෙත්සම;

(ii) කොළවෙණිගම, පල්ලෙගම, ආරණ්‍ය පාර යන ලිපිනයෙහි පදිංචි පී. එච්. සුරම්‍යා ප්‍රදීපිකා මහත්මියගෙන් ලැබුණු 2019.03.30 දිනැති පෙත්සම;

(iii) කුරුණෑගල, වැල්ලව, රංගම යන ලිපිනයෙහි පදිංචි ආර්. එස්. මුණසිංහ මහතාගෙන් ලැබුණු 2019.03.29 දිනැති පෙත්සම; සහ

(iv) හෝමාගම, මාවත්ගම, අංක 7/5 දරන ස්ථානයෙහි පදිංචි සුමිත්‍රා වීරසිංහ මහත්මියගෙන් ලැබුණු 2019.04.26 දිනැති පෙත්සම

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා විසින් පිළිගන්වන ලදී.

(8) කෝට්ටපොල (කෑගල්ල හරහා), හකහින්න, හපුගස්තැන්නේ හේන යන ලිපිනයෙහි පදිංචි බී. එච්. නිමල් චන්ද්‍රසිරි මහතාගෙන් ලැබුණු 2019.04.02 දිනැති පෙත්සම ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය විසින් පිළිගන්වන ලදී.

(9) මාතලේ, ඩෝල පාර, අංක 120/91/ඒ දරන ස්ථානයෙහි පදිංචි එම්. එෆ්. රිෆාන් මහතාගෙන් ලැබුණු 2019.05.06 දිනැති පෙත්සම ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය විසින් පිළිගන්වන ලදී.

30 (10) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ එම පෙත්සම්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

(අ.භා. 2.03 ට නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයා මූලාසනාරූඪ විය.)

**4 . සමාගම් (සංශෝධන) පනත් කෙටුම්පත** : දෙවැනි වර කියවීමේ නියෝගය කියවන ලදී.

"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය"යි කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව දිගුකාලීනව අවතැන්වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම, සමුපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන වැඩබලන අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

"ගරු ක. තුරෙයිරෙත්නසිංහම් මහතා මූලාසනාරූඪ විය යුතුය"යි, සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ නියෝජ්‍ය අමාත්‍යතුමා යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 3.07 ට ගරු ක. තුරෙයිරෙත්නසිංහම් මහතා මූලාසනාරූඪ විය.)

"ගරු හේෂා විතානගේ මහතා මූලාසනාරූඪ විය යුතුය"යි, ගරු ඩී. වී. චානක මහතා, ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා ස්ථිර කරමින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 3.57 ට ගරු හේෂා විතානගේ මහතා මූලාසනාරූඪ විය.)

"ගරු වේලු කුමාර් මහතා මූලාසනාරූඪ විය යුතුය"යි, අමාත්‍ය මණ්ඩලයේ සාමාජික නොවන ආර්ථික ප්‍රතිසංස්කරණ සහ පොදු සැපයීම් අමාත්‍යවරයා යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 5.03 ට ගරු වේලු කුමාර් මහතා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවැනි වර කියවන ලදී.

"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතුය"යි කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන්වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම, සමුපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන වැඩබලන අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තදනන්තරව පාර්ලිමේන්තුව සම්මති මාර්ගයෙන් කාරක සභාවකට පරිවර්තනය විය.

(කාරක සභාවේදී)

මූලාසනාරූඪ මන්ත්‍රීවරයා මූලාසනාරූඪ විය.

1 වැනි වගන්තියේ සිට 5 වැනි වගන්තිය දක්වා සභා සම්මත විය.

ප්‍රඥප්ති වගන්තිය හා නාමය

"ප්‍රඥප්ති වගන්තිය හා නාමය පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත සංශෝධන රහිතව වාර්තා කරන ලදී.

"පනත් කෙටුම්පත දැන් තුන්වැනි වර කියවිය යුතුය"යි කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව දිගුකාලීනව අවතැන්වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම, සමුපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන වැඩබලන අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත, ඊට අනුකූලව තුන්වැනි වර කියවා සම්මත කරන ලදී.

**5. කල් තැබීම (විශ්‍රාම වැටුප් විෂමතාව) :** "මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදින්, විවාද විය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය; අ.භා. 6.54 ට, 2019 ජුලි 25 බ්‍රහස්පතින්දා පූ.භා. 10.30 වනතෙක් පාර්ලිමේන්තුව කල් ගියේය.